# 22 ගරු මර්සලින් ජයකොඩි පියතුමා

කවියෙකු හා ලේඛකයකු වූ ගරු මර්සලින් ජයකොඩි පියතුමා ගෞරවාදරයට පාත්‍ර වූ සම්මානනීය කිතුනු පියතුමෙකි. මර්සලින් ජයකොඩි පියතුමා සමඟ පැවැත් වූ ගුවන් විදුලි සාකච්ඡාවක් මේ පාඩමට ඇතුළත් වෙයි.



නිවේදක : ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් ඉදිරිපත් කරන 'කලාකෙත' වැඩසටහනටය, මේ ඔබ සවන්දෙන්නේ. වෙනදා මෙන් ම අදත් කලා ලොවෙහි කලාකරුවකු සමඟ සුහද පිළිසඳරක යෙදීමටයි මේ සූදානම. අද කලා කෙතට සහභාගි වන්නේ සුප්‍රසිද්ධ ගීත රචකයකු වන ගරු මර්සලින් ජයකොඩි පියතුමායි. "ආයුබෝවන් ! පියතුමනි."

පියතුමා : "ආයුබෝවන් !"

නිවේදක : "පියතුමනි, ඔබතුමාගේ කලා ජීවිතය ඇරඹුණේ කොහොම ද?"

පියතුමා : "මම කුඩා කාලයේ ඉඳල ම කවි ගීතවලට ප්‍රිය කළා. පුංචි කාලෙ දී කවි ආදිය නිතර අහන්න ලැබුණා. අම්මා තාලෙට කවි ගායනා කළා. මම අම්මා ළඟට වෙලා ඒවා අහගෙන හිටියා. පස්සේ කාලෙ දී මම විවිධ

මාතෘකා යොදා ගෙන කවි නිර්මාණය කළා. ලියූ සමහර කවි පුවත්පත් සඟරාවල පළ වුණා. ඒ ආකාරයෙන් තමයි මම ගීත නිර්මාණය කරන්නටත් පෙලඹුණේ."

නිවේදක : "ඔබතුමා චිත්‍රපට සඳහා ගීත නිර්මාණයට යොමු වුණේ කොහොම ද?"

පියතුමා : "මම කොළඹ ශාන්ත පීතර විද්‍යාලයේ සේවයේ යෙදී සිටින කාලයේ මහත්මයෙක් ආවා මා සොයා ගෙන. ඒ තමයි ලෙස්ටර් ජේම්ස් පීරිස් මහත්මයා. එංගලන්තයේ සිට එතුමා ඇවිත් හිටියේ රේඛාව චිත්‍රපටය හදන්නයි. මා මුණගැහිලා මගෙන් ඉල්ලා හිටියා 'රේඛාව' සඳහා ගීත කීපයක් නිර්මාණය කරල දෙන්න කියල. ඉතින් මම ඒ ගීත නිර්මාණය කරල දුන්නා."

නිවේදක : ගරු මර්සලින් ජයකොඩි පියතුමා රේඛාව චිත්‍රපටය සඳහා නිර්මාණය කළ මේ ගීතයට අපි සවන් දෙමු.

වෙසක් කැකුළු අතු අග ඉඳ නටන විලාසේ
ඉරෙත් හඳෙත් සිරි විඳ විඳ රඟන විලාසේ
පියලි සලා - ලා රේණු හලා - ලා

සුවඳ උරා සිසිල් සුළං හමන්නේ
ලොවමැ අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ
දවට ගහේ ගහ මුදුනේ කොහා හඬන්නේ
කැරලා ද නාද දෙමින් ගහට කොටන්නේ
ටිං ටිං සද්දේ - ඒ මැද ඇද්දේ

ගම වටකර කුරුලු ගීත අවට ඇසෙන්නේ
ගිරා රංචු කජු රඹුටන් සොයා ඇදෙන්නේ
කදා වළලු දෑත දිගේ ටිකිරි ලියන්නේ
ටිකිරි ටිකිරි වළලු හඬයි ළපටි ළඳුන්නේ
ගීත ගයන්නේ ගයා නටන්නේ

කොලු කෙලි පොඩි ගී ගයමින් තුටින් නටන්නේ
ලොවමැ අවදි වෙමින් අමුතු පණක් ලබන්නේ

නිවේදක : "ඔබ තුමාගේ ගීතවල විශේෂ ලක්ෂණයක් තමයි ගීත සඳහා යොදාගෙන ඇති භාෂාවේ සරල බව. මේ ගීතයේ සාර්ථකත්වයට හේතු වූ තවත් සාධක තිබෙනවා ද?"

පියතුමා : "මේ ගීතයට මම යොදාගෙන තියෙන්නේ සරල භාෂාවක් වගේ ම මටසිලිටි භාෂාවක්. භාෂාව සරල වුවත් ගීත නිර්මාණයේ දී එය ප්‍රබල විදිහට යොදාගත යුතුයි."

නිවේදක : "භාෂාව ප්‍රබල විදිහට යොදා ගත යුතුයි යන්නෙන් අදහස් කළේ කුමක් ද?"

පියතුමා : "භාෂාව හසුරුවන ආකාරයට තමයි කවියක හෝ ගීතයක රසය මතුවන්නේ. රසය මතුවෙන ලෙස ගීතයක වචන යෙදිය යුතුයි. මේ ගීතයේ එක් තැනෙක තියෙනවා 'ලොවමැ අවදි වෙමින්' කියලා යෙදුමක්. මෙතන යෙදිලා තියෙන වචනවල අර්ථය ගත්තම ගීතයට කිසි ම ප්‍රයෝජනයක් නැහැ. නමුත් මේ යෙදුමෙන් මතුවන තව අදහසක් තියෙනවා. දවසේ උදාව කියවෙන මේ උදෑසන අවට පරිසරයේ දක්නට ලැබෙන බොහෝ දේ ධ්වනිත වෙනවා. මල් සුවඳ, සිසිල් සුළඟ, අරුණාලෝකය, කුරුලු ගීත මේ සියල්ලන් සමඟ තමයි දවසක ආරම්භය සිදුවන්නේ. උදෑසනක 'ලොවමැ අවදි වෙමින්' යන යෙදුමෙන් උදෑසනක ස්වරූපය නිරායාසයෙන් අපේ සිතට නැගෙනවා. මෙවැනි කාව්‍යමය යෙදුම් කීපයක් ම මේ ගීතයේ ඇතුළත් වෙනවා."

නිවේදක : "ඔබතුමාගේ ළමා අවධිය පිළිබඳ මතකයක් තිබෙනවා ද?"

පියතුමා : "මම උපන්නේ දංකොටුවේ, පාසල් ගියේ මාදම්පෙ සෙබස්තියන් පාසලට. පස්සෙ එහෙන් අස්වෙලා කොළඹ ශාන්ත ජෝෂප් විද්‍යාලයට ඇතුළු වුණා."

නිවේදක : "ඔබතුමා පැවිදි දිවියට ඇතුළු වුණේ මොන කාලයේ දී ද?"

පියතුමා : "මම ජ්‍යෙෂ්ඨ විභාගයෙන් පස්සේ පැවිදි දිවියට අවශ්‍ය දැනුම ලබාගන්න සෙමනේරියට ඇතුළු වුණා. 1927 අවුරුද්දේ දී තමයි පූජාවරය ලැබුවේ"

නිවේදක : ඔබතුමාගේ පැවිදි දිවිය කලා කටයුතුවලට බාධාවක් වුණේ නැද්ද?

පියතුමා : "නැහැ, පැවිදි ජීවිතය කලා නිර්මාණවලට තවදුරටත් රුකුලක් වුණා. ඒ කාලයේ දේවස්ථානවල ගායනා කළ දේව ගීතිකා බටහිර තනුවලට සිංහල වචන දාලා තමයි නිර්මාණය කරලා තිබුණේ. ඒ ගීතිකාවල මිහිරි බවක් තිබුණේ නැහැ. ඒ නිසා මම දේවස්ථානවල ගැයෙන ගීතිකා සඳහා මටසිලිටි පද සහ නාද මාලාවක් යොදා ගත්තා."

නිවේදක : ඔබතුමා විසින් රචනා කරන ලද සුදු සඳ එළියේ ගීතයත් එවැනි මටසිලිටි බස්වහරක් යොදා ගත් ගීතයක්. අපි මේ ගීතය පිළිබඳ ව කතා කිරීමට පළමුව ගීතයට සවන් දෙමු.

සුදු සඳ එළියේ නල මත පොපියන
හිරිමල් කැකුළක රොන් කෙමියේ
මුළු මල්වල ලොවැ ඉරණම සැතපේ
කුළු ගැන්වන මේ හිමිදිරියේ

සමනොල තුඩකින් - පිනිබිඳු පොදකින්
පණ ගැන්වෙන තුරු - හිමිදිරියේ
පහන් දොරින් - එන රැස් රේඛාවෙක
උණුසුම ඇසුරුව හිමිදිරියේ

ඉපැරණි කඳු යට සැඟවුණු මිණිකැට
පැන පැන බැස යන දිය දහරේ
ඇදී ඇදී හිඳ මතු වී එන විට
මැණික් තාරකාවලට හැරේ

පොඩි රේඛාවක රැස් රේඛාවෙක
මැණිකෙක මුළු ඉරණම සැතපේ
එක එක මැණිකක එක එක රූපෙක
එළියෙන් නැහැවුණු මලක් පිපේ

වලා පෙළින් සැදි මුතුකුඩයක් යට
තරඟ නඟා ලෙළදෙන මුහුදේ
සිඟිති දොරක් ඇති පොඩි බෙලි කටුවෙක
මුතු ඇටයක් සීරුවෙන් සැදේ

නිවේදක : "මේ ගීතය ස්වභාව සෞන්දර්යයේ චමත්කාරය අපූරුවට දනවන්නට සමත් වී තිබෙනවා. ඒ වගේ ම ගීතයේ පද මාලාවේ සුවිශේෂත්වයකුත් දක්නට ලැබෙනවා. මේ ගීතය සඳහා යොදාගත් භාෂාව පිළිබඳ ව ඔබතුමාට පැවසිය හැක්කේ කුමක් ද?"

පියතුමා : මේ ගීතයෙන් පැවසෙන්නේ ස්වභාව සෞන්දර්යයයි. ඒ සඳහා ඊට සුදුසු භාෂාවක් යොදා ගන්න අවශ්‍යයි. ඒ නිසා මම මේ ගීතය සඳහා සරල, ලාලිත්‍යයෙන් යුත්, ගීතවත් භාෂාවක් යොදා ගෙන තියෙනවා. 'නල මත පොපියන', 'රොන් කෙමියේ', 'සැඟවුණු මිණිකැට' වැනි යෙදුම්වල ඒ ලාලිත්‍යය රැඳිල තියෙනවා.

නිවේදක : "නෙත යන යන තැන වෙහෙරක් පෙනීයන්
වෙහෙරක් නැති තැනෙක වෙහෙරක් තැනීයන්"

මේ පද්‍යය ඔබතුමා අතින් නිර්මාණය වුණු එකක්. කතෝලික පියතුමකු වන ඔබතුමා අතින් මේ වගේ පද්‍යයක් නිර්මාණය වීමට තුඩු දුන් කරුණු මොනවා ද?

පියතුමා : "ශ්‍රී ලංකාව කියන්නේ බෞද්ධ සංස්කෘතිය පදනම් කොට ගෙන ගොඩ නැගුණු රටක්. ගමේ පදනම පන්සලයි. පන්සල කේන්ද්‍ර කර ගත් ගම් තමයි ලංකාවේ බොහෝ විට දකින්නට ලැබෙන්නෙ. එවැනි අත්දැකීමකින් තමයි මේ පද්‍යය ලියවුණේ."

නිවේදක : "පියතුමනි, ඔබතුමා පන්සලේ පියතුමා කියලත් හඳුන්වනවා.

ඉත්තෑපානේ ධම්මාලංකාර හාමුදුරුවෝ 'මල් පැලේ උපන් පන්සලේ පියතුමා' කියලා ඔබතුමා පිළිබඳ චරිතාපදානයක් ලියලා තියෙනවා. මම කැමතියි ඔබතුමාගෙන් ම දැන ගන්න ඔබතුමා මෙහෙම හඳුන්වන්නේ ඇයි කියලා."

පියතුමා : "පන්සලේ පියතුමා යන කතාව කියන්න හේතු වෙන්න ඇත්තේ මම නිතර හාමුදුරුවන් ඉන්න තැන්වලත් ඉන්න නිසා වෙන්න ඇති. මොකද පන්සල්වල, දහම්පාසල්වල උත්සවවලට ආරාධනා ලැබෙනවනෙ. ඉතින් මම ඒ අවස්ථාවන්ට සහභාගී උනා ම ඉන්නෙ හාමුදුරුවන් අතරෙනෙ. ඒ නිසා වෙන්න ඇති මට පන්සලේ පියතුමා කියන්නෙ. ඔය කතාවත් ප්‍රසිද්ධියේ කළ කතාවක්. පන්සලක තිබුණු උත්සවයකට සහභාගී වෙලා ඉන්න වෙලාවක ගුණදාස ලියනගේ මහත්මයා මෙහෙම කතාවක් කළා. 'අද සතුටුදායක දවසක් මෙතන ඉන්නවා පල්ලියේ හාමුදුරුවොත් පන්සලේ පියතුමත්.' පල්ලියේ හාමුදුරුවෝ කීවේ කාක්කපල්ලියේ අනුරුද්ධ හාමුදුරුවන්ට. පන්සලේ පියතුමා කීවේ මටයි. මේ කතාව තමයි, පන්සලේ පියතුමා කියලා හඳුන්වන්න හේතු වුණේ. මල් පැලේ උපන් කතාව මම ඉපදුණු ගෙදර හා සම්බන්ධයි. අපේ අම්මා ගෙදර ශුද්ධ පවිත්‍රතාව ගැන දැක්වූයේ දැඩි උනන්දුවක්. ඒ විතරක් නෙවෙයි. මුළු වට පිටාවත් මල් උයනක් වගේ අලංකාර කරලයි තිබුණේ. ඒ නිසා ම අවට අය අපේ ගෙදර හැඳින්වූයේ 'මල් පැල' කියලයි. ඒ නිසා තමයි මම ' මල් පැලේ උපන් පන්සලේ පියතුමා' වුණේ."

නිවේදක : "ඔබතුමාගේ ස්වභාව සෞන්දර්යය විඳීමේ ශක්තිය රේඛාව චිත්‍රපටයේ ගීතවලින් ප්‍රකාශ වෙනවා. මේ සඳහා ඔබතුමා ලැබූ අත්දැකීම් මොනවා ද?"

පියතුමා : "ගීත නිර්මාණයට කුඩා අවධියේ සිට ලැබූ අත්දැකීම් ඉවහල් කරගත හැකියි. මේ ගීත සඳහාත් මා ජීවිතය පුරා ලැබූ අත්දැකීම් ඉවහල් වුණා."

නිවේදක : "රේඛාව චිත්‍රපටය ජනප්‍රිය වීමට ඔබතුමාගේ ගීත නිර්මාණත් ඉවහල් වුණා නේ ද?"

පියතුමා : "ඔව්, රේඛාව චිත්‍රපටය නිසා මාත් ජනප්‍රිය වුණා."

නිවේදක : "රේඛාව චිත්‍රපටයේ ගීත අද පවා ජනප්‍රිය ගීත බවට පත් වී තිබෙනවා. මේකට හේතුව කුමක් ද?"

පියතුමා : "මේ ගීතවලින් නිරූපණය වන්නේ අව්‍යාජ ගැමි පරිසරයයි, සෞන්දර්යයයි. ඒ පරිසරය හා සෞන්දර්යය දූන හැඳිනගත් අයට බොහෝම අපූරුවට ගීත සමග අත්දැකීම් විඳගන්න ලැබෙනවා. මේ ගීත නිර්මාණය කිරීමට මා ජීවිතය පුරා ලැබූ අත්දැකීම් ඉවහල් වුණා."

නිවේදක : "ඔබතුමාගේ චිත්‍රපට ගීත රේඛාවට පමණක් සීමා වෙනවා ද? එහෙම නැත්නම් වෙනත් චිත්‍රපට සඳහා ගීත නිර්මාණය කර තිබෙනවා ද?"

පියතුමා : "චිත්‍රපට සඳහා තවදුරටත් ගීත නිර්මාණය කරන්න අදහසක් තිබුණේ නැහැ. මගේ හිතවත් මහත්මයකුගේ චිත්‍රපට කිහිපයකට ම ගීත නිර්මාණය කළා. ඒ 'මනමාලයෝ ' සහ 'ආදරවන්තයෝ' යන චිත්‍රපට දෙක සඳහායි."

නිවේදක : "රේඛාව චිත්‍රපටයේ ඉතා ජනප්‍රිය ගීතයක් තමයි. ඕලු නෙළුම් නෙරිය රඟාලා යන ගීතය. අපි ඒ ගීතයටත් සවන් දෙමු. මේ ගීතයත් සමග කලා කෙත වැඩ සටහන නිමාවට පත් වෙනවා. නැවත කලා කෙත වැඩ සටහනකින් හමුවීමේ බලාපොරොත්තුවෙන් අද වැඩසටහන නිමාවට පත් වෙනවා."

ඕලු නෙළුම් නෙරිය රඟාලා
කිකිණි හඬන වලා නඟාලා
ගඟුල් තොටිල්ලේ - මල් ඇතිරිල්ලේ
මගේ කුඩා ඔරුව හබල් ගා
යමු නැළැවිල්ලේ - නැළැවිල්ලේ - නැළැවිල්ලේ
ඇදී ඇදී යන්නැ නදී රිදී තොටිල්ලේ

කදා වළලු වගේ රැලි නැගේ
ඇණිය වටා දිය බෙදී හැළේ
මුරුත මල් දරා - සුළඟ මා කරා
ගලා එමින් සුවඳ කවන්නේ
යමු නැළැවිල්ලේ .....................

කිරල කිරලි කුඩුවේ ලගී
කුරුලු පන්ති නාද දී නගී
නැඹුරු වී බලා කුඩා සුදු වලා
ඔබේ රුවට වසී වෙලා නේ
යමු නැළැවිල්ලේ .....................

කබර ගොයා උගේ සුරතලී
සොයා ඇදේ නගා දිය සුලී
කොකුන් කිරි වගේ - නැගේ වෙල දිගේ
ඔබත් කොකුන් රැලක හැඩයි නේ
යමු නැළැවිල්ලේ .....................

## ක්‍රියාකාරකම 01

i. මර්සලින් ජයකොඩි පියතුමා සහෘදයන් අතර ජනප්‍රිය වූයේ කවර කලා ක්ෂේත්‍රයක් ආශ්‍රයෙන් ද?

ii. ගීත නිර්මාණයේ දී මෙතුමා වැඩි වශයෙන් ආභාසය ලැබූයේ කවර ආකාරයේ පරිසරයකින් ද?

iii. රේඛාව එතුමා ලියූ ගීත ඇතුළත් චිත්‍රපටයකි. ඒ හැර එතුමාගේ ගීත ඇතුළත් වෙනත් චිත්‍රපට මොනවා ද?

iv. දේවස්ථානවල ගීතිකා සඳහා එතුමාගේ දායකත්වය කෙබඳු වී ද?

v. සිංහල සංස්කෘතිය පිළිබඳ එතුමාගේ අදහස් පිළිබිඹු වන අවස්ථාවක් උපුටා දක්වන්න.

vi. 'පන්සලේ පියතුමා' ලෙස මෙතුමා හැඳින්වීමට තුඩු දුන් හේතු සාධක පැහැදිලි කරන්න.

vii. මේ පාඩමෙහි ඇතුළත් ගීතවල කාව්‍යෝක්ති යෙදුම් උපුටා දක්වන්න.

## ක්‍රියාකාරකම 02

**මේ වාක්‍ය කියවන්න.**

* ගුවන් විදුලි මැදිරියට පැමිණ සිටින්නේ ගරු මර්සලින් ජයකොඩි පියතුමායි
* අද 'කලා කෙත' වැඩසටහනට සහභාගී වන්නේ ප්‍රවීණ ගීත රචකයෙකි.
* මේ ගීතය ගායනා කරන්නී දක්ෂ තිළියකි.
* අද තරගයෙන් දිනන්නෝ දක්ෂයෝ ය.

මේ වාක්‍යවල සිටින්නේ, වන්නේ, කරන්නී, දිනන්නෝ යන පද කෘදන්ත නාම පදය. වචන භේදය හා ලිංග වශයෙන් මේ නාම පද වෙනස් වී ඇති ආකාරය හඳුනා ගන්න.

01. පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට සුදුසු කෘදන්ත පද වරහනින් තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.

(ලබන්නේ, යන්නෙමි, කරන්නේ, හමන්නේ, වන්නෝ, කරන්නී)

i. සාකච්ඡාවට සහභාගි ................................. විද්වත්හු ය.

ii. මේ ගීතය ගායනා .................................... ළමා ගායිකාවකි.

iii. මේ සුළං .......................................... නිරිත දිගිනි.

iv. අද උපහාර ............................................. ලේඛකයෙකි.

v. තරගය ජයග්‍රහණය ....................................... සැබෑ දක්ෂයෝ ය.

vi. මම ගෙදර ..................................... මිතුරෙකු හමුවීමි.

## ක්‍රියාකාරකම 03

i. මර්සලින් ජයකොඩි පියතුමාගේ ජීවිතයේ විශේෂ අවස්ථා ඇසුරින් කතාවක් කරන්න.

ii. මර්සලින් ජයකොඩි පියතුමාගේ වෙසක් කැකුළු ගීතය පිළිබඳ ඇගයීමක් කරන්න.

iii. මේ වැඩසටහන අගය කරමින් ගුවන් විදුලි සංස්ථාවේ කලාකෙත වැඩසටහන් නිෂ්පාදකවරයාට යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

## ක්‍රියාකාරකම 04

01. වන වගුව: වැඩසටහන් ශ්‍රවණය හා නැරඹීමට මෙවැනි කාලසටහනක් භාවිත කරන්න.

| දවස | වැඩසටහනේ නම | මාධ්‍ය රූපවාහිනි/ගුවන් විදුලි | විකාශනය වන වේලාව | කාලය |
|---|---|---|---|---|
| | | | | |

02. වන වගුව: වැඩසටහන් ශ්‍රවණය /නරඹා තොරතුරු සටහන් කර ගැනීම සඳහා මෙම වගුව යොදා ගන්න.

| වැඩසටහනේ නම | මාතෘකාව | සහභාගි වන සම්පත් දායකයින් පිළිබඳ | අන්තර්ගත කරුණු | ඔබ අලුතින් උගත් වචන හා යෙදුම් |
|---|---|---|---|---|
| | | | | |

වැඩසටහන් නැරඹීමෙන් හා ශ්‍රවණයෙන් අත්පත් කරගත් භාෂා කුසලතා උපයෝගී කරගෙන වැඩසටහන්වලට සජීවී ව සම්බන්ධ වීමට හා ලිපි මඟින් අදහස් ප්‍රකාශ කිරීමට යොමු විය යුතු ය.